සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

මගේ අංකය / எனது இல / My No: DSD/HQ/04/EER/P.M.V./2018

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2018.04.02

**සමෘද්ධි චක්‍රලේඛ අංක 2018/10 ( ආර්ථික සවිබලගැන්වීම් )**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන
**" සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන "** වැඩසටහන - 2018

වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබල ගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ පුරෝගාමී ආයතනයක් බවට පත්වීම දෙපාර්තමේන්තුවේ දැක්ම වන හෙයින් දිළිඳුකම පිටුදැකීම උදෙසා වූ රාජ්‍ය ප්‍රතිපත්තියට සමගාමීව, නිෂ්පාදන ගම්මාන තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම සඳහා 2018 වර්ෂයේද *නිෂ්පාදන මූලික කරගත්* **" සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන"** වැඩසටහන ක්‍රියාත්මක කිරිමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සැලසුම් සකස් කර ඇත.

02. 2017 වර්ෂයේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදි ඔබ ඇතුළු සියළු සමෘද්ධි නිලධාරින් දක්වන ලද දායකත්වය මෙහිදි ඉතා අගය කොට සලකන අතර ලබා ගත් එම අත්දැකීම් ද පාදක කරගනිමින් සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීමම ඉලක්ක ගත කොට පහත සඳහන් අරමුණු ඉටු කර ගැනිමට හැකිවන පරිදි 2018 වර්ෂයේදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු බව විශේෂයෙන් පෙන්වා දෙමි.

- කෘෂිකාර්මික, සත්ත්ව පාලන, ධීවර, කර්මාන්ත, හා සේවා සැපයීම් යන කුමන හෝ නිෂ්පාදන කටයුත්තක් වර්ධනය කල හැකි විය යුතුය.
- අගය එකතු කළ නිෂ්පාදනයන් සඳහා විශේෂ අවධානය යොමු කල යුතුය.
- සමෘද්ධි ව්‍යාපාරයට අනන්‍යවූ "සමෘද්ධි නිෂ්පාදනයන්" එළිදැක්වීමට හැකිවන පරිදි ආදර්ශ ගම්මානයේ සංවර්ධන කටයුතු දියත් කළ යුතුය.
- නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාල වූ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- අලෙවි සබඳතා සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධිකරණයන් ගොඩ නැගීම.
- නිශ්චිතව සවිබල ගැන්විය හැකි සමෘද්ධිලාභී පවුල් හඳුනා ගැනිම හා ගම්මානයේ සියළු සමෘද්ධිලාභී පවුල් අදාල නිෂ්පාදන කටයුතු සඳහා දායක කර ගැනිම.
- විශේෂයෙන් දැකුම්කළු තුරුලතා බහුල පරිසර හිතකාමී ගමක් නිර්මාණය කිරිම.

## 03. ගම්මාන තෝරා ගැනීම

i. **එක් දිස්ත්‍රික්කයකින් ගම්මාන 02 ක් තෝරා ගත යුතුය. ( මේ වන විට මා වෙත එවන ලද ගම්මාන 05 න් වඩාත් සුදුසු ගම්මාන 2 ක් තෝරා ගත යුතුය.)**

ii. නිෂ්පාදනයේ යෙදෙන පිරිසෙන් 70% ක් සමෘද්ධිලාභි පවුල් විය යුතුය.

iii. ඉතිරි 30% අඩු ආදායම්ලාභීන් විය යුතු අතර එම අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යාපෘති තුලින් අවම වශයෙන් එක් ව්‍යාපෘතියකින් එක් සමෘද්ධිලාභියෙකුගේ හෝ මාසික ආදායම වැඩි කිරීමට හැකියාව පවතින බව ව්‍යාපෘතිය අනුමැතියට පෙර සනාථ කල යුතුය.

iv. නිෂ්පාදන හෝ සේවාව බහුතරය සම ජාති විය යුතුය.

v. නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මෙන්ම වෙළඳපල සඳහාද විභවතාවයක් පැවතීම හා අවශ්‍ය යෙදවුම් ප්‍රමාණවත්ව පැවතීම.

vi. ව්‍යාපෘතිය මගින් කෙටි කාලයක් තුලදී ප්‍රතිලාභ ලබා ගත හැකි විය යුතු අතර ඉන් සෘජුවම ජීවන තත්ත්වය වැඩිදියුණු කළ හැකි විය යුතුය.

vii. නිෂ්පාදනයේ යෙදෙන පිරිස තම ජීවන මාර්ගය වැඩිදියුණු කර ගැනීමට උනන්දුවක් දක්වන අය වීම අත්‍යාවශ්‍ය වනු ඇත.

*viii.* තවද මෙලෙස තෝරාගනු ලබන ගම්මානයන්ට අදාල සම නිෂ්පාදන සිදු කරන අවට ගම්මාන වේ නම් එම ගම්මාන ද ඇතුලත්ව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ පොකුරු ගම්මානයන් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය.

## 04. ප්‍රතිලාභීන් හඳුනා ගැනීම

i. නිෂ්පාදනයේ හෝ සේවාවේ නියුතු සමෘද්ධී ප්‍රතිලාභීන් ( ඡේද අංක 03 හි ii පරිදි) ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.

ii. එහෙත් අදාල නිෂ්පාදනය හෝ සේවාව සමග අලෙවි කිරීම, වෙළඳපල සබඳතා, අමුද්‍රව්‍ය සැපයීම, සහාය සේවා සැපයීම, නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර සැපයීම වැනි සෘජුව නිෂ්පාදන හෝ සේවාව හා සම්බන්ධ වන සමෘද්ධිලාභී නොවන අඩු ආදායම් ලාභීන්ටද වැඩසටහන මගින් ප්‍රතිලාභ ලැබිය හැකි අතර එම අඩු ආදායම්ලාභී ප්‍රමාණය මුළු ප්‍රතිලාභී ප්‍රමාණයෙන් 30% නොඉක්ම විය යුතුය. අදාල නිෂ්පාදන දාමයේ අඩු ආදායම්ලාභී කාන්තා මූලික පවුල් දායක කර ගනිමින් වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.

## 05. නිෂ්පාදන සංවර්ධන සැලැස්ම සකස් කිරීම

ප්‍රාදේශිය ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි, මූලස්ථාන කළමණාකරු, අදාල සමෘද්ධි බැංකු කළමණාකරු, ව්‍යාපෘති කළමණාකරු සමඟින් සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් ප්‍රජා මූල නියෝජිතයන්ගේද සහභාගිත්වයෙන් ඡේද අංක 2 යටතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම ඉලක්ක කර ගනිමින් මේ සමග අමුණා ඇති ඇමුණුම අංක 01 ට අනුව ආදර්ශ ගම්මාන ව්‍යාපෘති වාර්තාව 2018.04.20 දිනට පෙර සකස් කළ යුතුවේ.

සකස් කරන ලද එම සංවර්ධන සැලැස්ම හා ප්‍රතිලාභි ලැයිස්තුව සඳහා,

i. සහාය සේවා / තාක්ෂණික සේවා නිලධාරින්ගේ නිර්දේශ ලබා ගැනිම.
ii. දිස්ත්‍රික් ලේකම්ගේ / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනිම.
iii. 2018.04.25 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ප්‍රතිපාදන ලබා ගැනිමට කටයුතු කළ යුතු වේ.

## 06. ප්‍රතිපාදන වෙන් කිරිම

1. තෝරා ගනු ලබන එක් නව ගම්මානයක් සඳහා රුපියල් මිලියන 4 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අනුමත කරනු ලැබේ.

2. වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමාව යටතේ එක් ප්‍රතිලාභි ව්‍යාපෘතියක් වෙනුවෙන් උපරිම දෙපාර්තමේන්තු දායකත්වය රු. 45,000 /- වේ.

3. උපරිම දෙපාර්තමේන්තු දායකත්වය 60 % ක් වන අතර අවම ප්‍රතිලාභි දායකත්වය 40% ක් විය යුතු වේ. ප්‍රතිලාභි දායකත්වය ශ්‍රමය, අමුද්‍රව්‍ය හෝ වෙනත් දායකත්වයක් විය හැකිය.

## 07. අධීක්ෂණය, මෙහෙයවීම හා ඇගයිම

1. ඡේද අංක 05 හි සඳහන් පරිදි නිෂ්පාදන සංවර්ධන සැලැස්ම සකස් කරන ලද කමිටුව මසකට වරක් රැස්වී, නිෂ්පාදන සැලැස්ම නියමිත අරමුණු කරා යන්නේද පිළිබඳව සාකච්ඡා කිරිම, ඊට අවශ්‍ය පියවර ගැනිම හා යාවත්කාලීන කිරිම කළ යුතු වේ.
2. මුලස්ථාන කළමණාකරු, අදාල සමෘද්ධි බැංකු කළමණාකරු, ව්‍යාපෘති කළමණාකරු සමඟින් සමෘද්ධි සංවර්ධන නිලධාරිගේ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරිගේ නිරන්තර අධික්ෂණය යටතේ සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය.
3. මෙහිදී ප්‍රජා මූල සංවිධාන ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයන් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කළ යුතු වේ.

4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මාසික දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීමේදි සියළු නිලධාරින්ට ආදර්ශයක් ලබා ගැනිම සඳහා මෙම වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනය කිරිම වඩාත් වැදගත් වනු ඇත.

5. ප්‍රගතිය අවශ්‍ය ඕනෑම විටක ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි පරිදි සකස් කිරිමටත් යාවත්කාලින කිරිමටත් කටයුතු කළ යුතු වේ.

6. දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ /දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරි විසින් තම දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මානයන් කෙරෙහි සමස්ථ අධීක්ෂණය සිදු කළ යුතු අතර **'සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම '** සඳහා නිරන්තර අවධානයක් යොමු කිරිම මින් අවධාරණය කරමි.

## 8. පරිපාලන වියදම්

- මෙම වැඩසටහන යටතේ දරනු ලබන රජයේ වියදමෙන් 2.0 % ක් පරිපාලන වියදම් ලෙස දැරීමට හැකියාව ඇති අතර ඉන් 0.5% ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ද, ඉතිරි 1.5 % ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ද බෙදී යන පරිදි විය යුතුය.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය මුදල් රෙගුලාසි, මෙම චක්‍රලේඛ උපදෙස් හා අදාල වෙනත් චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් ක්‍රියාත්මක කළ යුතු අතර සම්මත මිලගණන්ද සැලකිල්ලට ගෙන අදාල රේඛීය ආයතන වල නිර්දේශයන්ද ලබා ගෙන ගෙවීම් කිරීම අත්‍යවශ්‍ය වේ.

මෙම චක්‍ර ලේඛය පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වුවහොත් දුරකතන අංක 011-2873801 / 011-2869824/ 011-2872253 මගින් හෝ divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනය මඟින් සමාජ සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය අමතන්නේ නම් මැනවි.

සමෘද්ධි නිෂ්පාදන සපිරි ආදර්ශ ගම්මානයක් නිර්මාණය කිරීමෙහි ලා ඔබ ඇතුළු නිලධාරින් දක්වන සහාය ඉතා අගය කොට සලකමි.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ ගරු අමාත්‍ය එස්.බී දිසානායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
2. සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
3. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ගැ.ස.
4. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ගැ.ස.
5. ලේකම්, සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
6. අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන /සමෘද්ධි) සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය -කා.දැ.ගැ.ස.
7. ප්‍රාදේශීය ලේකම් .................. -කා.දැ.ගැ.ස හා අ.ක.ස
8. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
9. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
11. සියළුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
12. සියළුම සම්බන්ධිකරණ නිලධාරින් - අ.ක.ස
13. සමෘද්ධි මූලස්ථාන කළමණාකරු .......................... - අ.ක.ස හා අදාල මහාසංගම් කළමණාකාර අධ්‍යක්ෂ/ සමෘද්ධි ව්‍යාපෘති /ප්‍රජා මූල බැංකු කළමණාකරු සහ සමෘද්ධි සංවර්ධන නිලධාරී දැනුවත් කිරීම සඳහා